## 12 ශ්‍රේණිය - ආර්ථික විද්‍යාව - 1 වන සතිය - මැයි 4,5 හා 6

නිපුණතාව 5 - සාර්ව ආර්ථික ක්‍රියාකාරීත්වය සැලකිල්ලට ගනිමින් ජාතික ගිණුම් සකස් කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි.

## සාර්ව ආර්ථික අරමුණු

සමස්ත ආර්ථික ක්‍රියාකාරීත්වය තුළින් සමාජයක් ඉටුකර ගැනීමට අපේක්ෂා කරන ආර්ථික අරමුණු-මේවා සමස්ත සමාජයේ පොදු යහපැවැත්ම උදෙසා ළඟා කර ගැනීමට අපේක්ෂා කරන ආර්ථික අරමුණුය.

1.පූර්ණ සේවා නියුක්තිය  - වැඩ කළ හැකි වයසේ පුද්ගලයින් අතරින් වැඩ කිරීමට සූදානම් සියලුම පුද්ගලයින්හට යෝග්‍ය රැකියා පැවතීම.

2.මිල ස්ථායීතාව- ආර්ථිකයේ සියලු භාණ්ඩ හා සේවාවල සාමාන්‍ය මිල නැතිනම් මිල මට්ටම දැඩි උච්චාවචනවලින් තොරව පවත්වා ගැනීම.

3.බාහිර ස්ථායීතාව - විදේශ විනිමය ලැබීම් හා ගෙවීම් සමාන මට්ටමකින් පවත්වා ගැනීම සහ විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම.

4.සාධාරණත්වය  - සමාජයේ පුද්ගලයන් අතර ආදායම හා ධනය සමානව බෙදී යාමේ තත්ත්වය

5.ආර්ථික වර්ධනය - රටක මූර්ත නිමැවුම දිගුකාලීන වශයෙන් ඉහළ යාම.මෙහිදී  නිමැවුම සමඟ නිශ්පාදන ධාරිතාවද ඉහළ යා යුතුය.

6.තිරසාර සංවර්ධනය - අනාගත පරපුරේ වුවමනා ඉටු කර ගැනීමට  ඇති හැකියාවට හානියක් නොවන ආකාරයට වර්තමාන පරපුර විසින් ළඟා කර ගන්නා දියුණුව.මෙහිදී ආර්ථික,සමාජීය හා පාරිසරික යන පැතිකඩ තුනම සමබරව පවත්වා ගත යුතුය.

## සාර්ව ආර්ථික විචල්‍යයන්

සමස්ත ආර්ථික ක්‍රියාකාරීත්වයට බලපෑම් කරනු ලබන සමාහාර ආර්ථික විචල්‍යයන් සාර්ව ආර්ථික විචල්‍යයන් ලෙස හැඳින්වේ.මූලික සාර්ව ආර්ථික විචල්‍යයන් පහත දැක්වේ.

1.දළ දේශීය නිෂ්පාදිතය(ආර්ථිකයේ සමස්ත නිමැවුම)

2.සේවා නියුක්තිය

3.මිල මට්ටම

4.සමාහාර ඉල්ලුම

5.විනිමය අනුපාතය

6.ගෙවුම් ශේෂය

7.මුදල් සැපයුම හා මුදල් ඉල්ලුම

8.ඉතුරුම්,පරිභෝජනය හා ආයෝජනය

## සාර්ව ආර්ථික ගැටළු

දළ දේශීය නිෂ්පාදිතය,සේවා නියුක්තිය හා මිල මට්ටම ආදි සාර්ව ආර්ථික විචල්‍යයන් සමාජය අපේක්ෂා කරන සාමාන්‍ය මට්ටමෙන් (අහිතකර ලෙස) ඉවතට ගමන් කිරීම සාර්ව ආර්ථික ගැටළු වශයෙන් සැලකේ.එවැනි මූලික සාර්ව ආර්ථික ගැටළු කීපයක් පහත දැක්වේ.

1.ආර්ථික පසු බැසීම හා ප්‍රසාරණය (මූර්ත නිමැවුම අපේක්ෂිත මට්ටමෙන් පහළට හා ඉහළට ගමන් කිරීම.

2.සේවා වියුක්තිය (ශ්‍රමිකයින් පිරිසක් විරැකියාවෙන් පෙළීම.)

3.උද්ධමනය (මිල මට්ටම දිගුකාලීනව ඉහළ යාම)

4.ගෙවුම් ශේෂ හිඟය(විදේශ විනිමය ගෙවීම් ලැබීම් ඉක්මවා යාම)

5.විනිමය අනුපාතය ක්ෂය වීම(මුදලේ බාහිර අගය අඛණ්ඩව පහළ වැටීම.)

## සාර්ව ආර්ථික ප්‍රතිපත්ති

සාර්ව ආර්ථික ගැටළු විසඳීම සඳහා රජය විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවලට අයත් වේ.මේවායින් අපේක්ෂා කරනුයේ ආර්ථිකය සාමාන්‍ය මට්ටමේ පවත්වා ගෙන යාමයි.මූලික වශයෙන් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති තුනක් තිබේ.

1.රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය/ෆිස්කල් ප්‍රතිපත්තිය

2.මූල්‍ය ප්‍රතිපත්තිය

3.සැපයුම් අංශයේ ප්‍රතිපත්ති

- රාජ්‍ය ආදායම( බදු ),රාජ්‍ය වියදම හා රාජ්‍ය ණය යොදා ගනිමින් සාර්ව ආර්ථික විචලායයන් හැසිරවීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මගින් සිදුවේ.
- මුදල් සැපයුම හා මූලික පොලී අනුපාතය යොදාගෙන සාර්ව ආර්ථික විචලායයන් හැසිරවීම මූල්‍ය ප්‍රතිපත්තිය මගින් සිදුවේ.
- සාධක ඵලදායීතාව ඉහළ නැංවීම තුළින් සමාහාර සැපයුම ඉහළ දැමීමට අනුගමනය කරන ප්‍රතිපත්ති සැපයුම් අංශයේ ප්‍රතිපත්තිවලට අයත්වේ.
- ඉහත ප්‍රතිපත්තිවලට අමතරව රජය ආදායම් ප්‍රතිපත්ති,විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති,කර්මාන්ත ප්‍රතිපත්ති,පාරිසරික ප්‍රතිපත්ති හා සෘජු පාලන ක්‍රම ආදියද සාර්ව ආර්ථික කළමනාකරණය සඳහා යොදා ගනී.